ඉඩ දෙන්න හිතාගෙන... පිස්සු නං හිතන්න එපා හොඳේ... මෙයා වගේ පොරක් කසාද බඳින්න තරම් පිස්සුවක් මට නම් නැහැ.. මේ නිකම් හිතවත් කමට ආව ගමනක් විතරයි" දොර අසළ සිට බලා සිටින ස්නේහා චාපාගේ කතාව අසා සිට සිනාසුනා ය.

"අනේ නැහැ මිස්.. මං එහෙම හිතුවෙ නැහැ" ස්නේහා කීවේ ඇත්තක් නොවේ. ඇය හිතුවේම - දැනුත් හිතන්නේම චාපා අකලංකගේ පෙම්වතිය විය හැකිය කියා මය. එසේ නොවේ නම් මේ හැංගී සිටින මිනිහා බලන්නට දුවගෙන එන්නට හේතුවක් නැති යයි ඇයට සිතෙයි. "මං මේළඟ පාත ඉන්නවා.. මාව ඕනෙ වුණොත් බසර් එක ඔබන්නකො" ස්නේහා නැවත කීවා ය.

චාපා හිස සළා එකඟතාව පළකළා ය.

ස්නේහා කාමරයේ දොර ඇරියා ය. ඇයට පිටව යන්නට නොහැකි වූයේ දොර අසළ සිටගෙන සිටි තැනැත්තා නිසා ය. ඔහු තළතුනා මිනිසෙකි. උස මහත ය. මුහුණේ යම් කරුණාවන්ත බවක් ඇඳී තිබුණද පැළඳ සිටි කණ්නාඩි දෙකට යටින් වූ බැල්ම දැඩි එකක් විය. ඔහු පිටුපසින් සිටගෙන සිටි මිනිසුන් දෙන්නා ආරක්ෂකයන් දෙ-දෙනකුයයි ස්නොහා සිතුවා ය.

"තමුන්...?" ඔහු දිගු කළ ඇඟිල්ල එල්ල වුණේ ස්නේහා දෙසටය. ප්‍රශ්නයත් ඇයටම ය.

"ම... මම.." ස්නේහා ගොත ගැසුවා ය.

"තමුන් නර්ස් ද?" ඒ ස්වරය ඉතා දැඩි ය.

"එහෙමයි"

"ස්නේහා ද?"

"එහෙමයි" ස්නේහා උත්තර දෙන්නේ මවිතයෙනි. ඔහු තමාගේ නම දන්නේ කෙසේදැයි ඇයට සිතාගන්නට නොහැකි ය.

"තමුන් මාව අඳුනනවද?"

"නැහැ සර්"

"ඒක හොඳයි.. මං අකලංකගෙ තාත්තා" එපමණක් කියා ඩේමියන් අමරසේකර කාමරයට ඇතුල්විය. යන්නට ගිය ගමන නවත්තා ස්නේහාද ඔහු පසුපසින් නැවත කාමරයට ඇතුල්වූවා ය. ආරක්ෂකයන් දෙදෙනා කාමරයේ දොර අසළ නැවතුණ බව ඈ දුටුවා ය.

> "අපේ පන්සල කියලා විශේෂත්වය මොකක්ද? මේ කොළඹ ඕනෙ තරම් පන්සල් තියෙන්නෙ. කොයි පන්සලට ගියත් එකම පින තමයි ලැබෙන්නෙ"

"ආ.. චාපාත් ආවද?" ඩේමියන් අකලංකට කෑම කවමින් සිටි චාපා දැක ඇසුවේ ය. " ..ඔයා කොහොමද අකලංක මෙතෙන ඉන්න බව දැනගත්තෙ?" ඔහු ඇසූ නමුත් චාපා පිළිතුරක් නොදුන්නා ය. කෑම කැවීම නවත්තා පසෙකට වූවා ය.

"දැන් තමුන් එක එක්කෙනාට කියලා කෑම කවාගන්නෙ මොකක් හරි ලෙඩක් තියෙනව කියල පෙන්නන්නද?" ඩේමියන් අකලංක දෙස එක එල්ලේ බලා ඇසුවේ ය.
"න්නෑ තාත්තා.. මේ.. මේ"
අකලංක පිළිතුරක් සොයාගත නොහැකිව ඇඹරුණේ ය.

"මේ තරම් කරදර දාගෙනත් මේ මනමාලකම ඉවරයක් නැහැනෙ... මොනාද අයිසෙ මේ අපට කරන කරදර... මේවයෙ ඉවරයක් නෑනෙ.."

අකලංක පිළිතුරක් නොදී ස්නේහා දෙස බැලුවේ ය. ස්නේහා ඔවුන්ගේ කතාව නෑසුණා සේ කාමරයේ ජනේලය අසළට ගොස් එතුළින් පහළින් පෙනෙන ගොඩනැගිලි දෙසත් ඒ මැදින් ඇදී යන මං මාවත් දෙසත් බලා සිටියා ය. තාත්තාගේත් පුතාගේත් කතාවේ වචනයක් දෙකක් වරින් වර ඇගේ සිතට වැටුණත් ඒ ගැන අවධානය යොමු නොකර සිටින්නට ඈ උත්සාහ කළා ය.

"මේවට ඇහුම්කන් නොදී ඉන්න එක හොඳයි ස්නේහා" ස්නේහා හැරී බලද්දි ඈ දුටුවේ තමා අසළින්ම සිටගෙන සිටින චාපා ය. ස්වේහා යමක් නොකියා සිනාසෙන්නට උත්සාහ කලා ය. ".. ජීවිතේම ප්‍රශ්න වැලක් කරගත්ත අකලංක වගේ මිනිස්සු මේ අයගෙ සමාජයේ ඕනෙ තරම් ඉන්නවා.. ඒ අය සොයන්නෙ ගැලවීම නෙවෙයි.. හරිම වචනෙ කියනවා නම් වැනසීම.. මෙයාල ප්‍රශ්න වලට උත්තර හොයන්නෙ තවත් ප්‍රශ්න දාහක් ඇතිකරගෙන"

සංවාදයක් පවත්වාගෙන යන්නට කුමක් කිව යුතුදැයි ස්නේහාට නොදැනේ.

"ඔයා මේ කතා එක කනකින් අහලා අනිත් කනෙන් පිට කරලා දාන්න.. ඔලුවට දාගන්න එපා.. තේරුමක් නැහැ.. මං යනවා" ස්නේහාට යන්නමින් සිනාවකින් සංග්‍රහ කළ චාපා පිටව ගියා ය. ඒ පිළිබඳව කිසිම අවධානයක් නොයොදා තාත්තාත් පුතාත් තවමත් බරපතළ කතාවේ ය. එහෙන් මෙ-හෙන් ඇසෙන වචනයකින් දෙකකින් අදහසක් ගොඩනගා ගන්නට ඉඩ තිබුණත් ඇගේ සිතේ ඒ ගැන උනන්දුවක් නොවී ය.

එක් මොහොතක කතාව අවසන් කළ ඩේමියන් යන්නට හැරුණේය. ඒස මගම යමක් සිහිපත් වූවාක් මෙන් ස්නේහා වෙත ආවේ ය.

"ස්නේහා.. අකලංක මෙතැන ඉන්නවා කියන එක රහසක්.. ඒක මතක තියාගන්න.. තමුන්ව තෝරලා බේරලා අකලංක බලාගන්න දැම්මෙ තමුන් විශ්වාස කරන්න පුලුවන් කෙනෙක් කියලා හැමෝම කිව්ව නිසයි.. මේ කරදර අහවරක් කරගන්නකංවත් ඒ විස්වාසෙ රකින්න ඕනෙ... තේරුණා ද?" ඔහු කීවේ ය.

"එහෙමයි" ස්නේහා කීවා ය.

"තමුන් පදිංචි වෙලා ඉන්නෙ කොහෙද?"

"මහරගම.. බෝඩිමක"

"අද හවසට තමුන්ට බෝඩිමට යන්න හෙ-ාස්පිට්ල් එකෙන් වාහනයක් දෙයි.. උදේට එක්ක එන්නත් එතැනට ඒ වාහනේ එයි.. ඒ ඇරෙන්න මේ දවස් දෙක තුනේ වෙන කොහෙවත් යන්න එන්න තහනම්.. තේරුණා ද? අරය මෙයා එකක් කතාවට යන්නැතුව ඉන්නවා හොඳයි.. ඒ ඇරෙන්න තමුන්ට යමක් අවශ්‍ය වෙනවා නම් මේට්‍රන්ට කියනවා.. ඒ හැම දෙයක්ම ලැබෙයි"

"තාත්ත මොනාද කීවවෙ?" ඩේමියන් පිටව ගිය පසු අකලංක ඇසුවේ ය.

"විශේෂ දෙයක් නැහැ සර්" ස්නේහා කීවා ය. ඇය තවමත් සිටින්නේ වික්ෂිප්ත වූ සිතිනි. නිසකලංකාව ජීවිතය ගෙවමින් සිටිය තමාගේ හිස මතට මේ අනවශ්‍ය කරදරයක් වැටීම ගැන ඇය සිටියේ අසතුටෙනි.

"මටත් මේ සිද්ද වෙන දේවල් මහ වදයක් ස්නේහා" අකලංක ඇරඳෙන් නැගිටවාති ස්නේහා අසළින්ම සිටගෙන ජනේලයෙන් පහළ බැදුවේ ය. "ජීවිතේ වෙනස්කරගන්න ඕනෙ ස්නේහා"

ස්නේහා ජනේලය අසලින් මෑත්ව මේසය මත වූ කෑම බඳුන් අස්පස් කළා ය.

"මේ ක්ලබ්ස් යන වැඩෙන් තමයි හැම කරදරයක්ම වැටුණෙ.. ස්නේහා ගෙදර ඉන්නකොටා හවසට මොකද කරන්නෙ?" අකලංකා ඈ දෙස හැරී බැලුවේ ය.

"ගෙදර ඉන්න කාලෙ හවසට මිදුල් අතුගානවා.. බුදුන් වඳිනවා.. සමහර දවස්වලට පන්සල් යනවා" ඒ කියද්ධිම ස්සේහාට ගම මතක් විය. පන්සල මතක් විය. අරලිය මල් වැටුණ පස්නල් බිමේ සුදු වැලි මලුව මතක් විය. ඒ වැලි මත පා තබා පන්සල පුරා ඇවිද ගිය හැටි මතක් විය. "ඕගොල්ලන්ගෙ ජීවිත හරිම සරළයි.. මං ඒකට ආසයි.. මාත් ආසයි ඔයාලගෙ පන්සලය යන්න"

ස්නේහා සිනාසුණා ය.

"අපේ පන්සල කියලා විශේෂත්වය මොක-ක්ද? මේ කොළඹ ඕනෙ තරම් පන්සල් තියෙන්නෙ.ඩ කොයි පන්සලට ගියත් එකම පින තමයි ලැබෙන්නෙ" ඈ සිනා-සෙමින් කීවා ය. ඔහු සිනාසුණේ නැත . ඒවෙනුවෙට මහා ගැඹුරු බල්මකින් ඇය දෙස බලා සිටියේ ය.

"මට කොළඹ එපා වෙලා" අවසානයේ දී ඔහු කීවේ ය.

**මතු සම්බන්ධයි**

26 වන පිටෙන්

ප්‍රේමකීර්ති ද අල්විස් ගේ පෑන් තුඩින් රචිත මෙම ගීයද කාලය - දීපය - දේශයක් නොසගවා කෙරෙන අපූර්ව බොදු ප්‍රාර්ථනාවකින් යුක්තවූවකි සංසාර ගින්නෙන් දැවෙන සක්වයාට බුදු හිමි දැකීම ලද හැකි ඉහළම භාග්‍යය වේ මෙය වික්ටර් රත්නායකයන්ගේ මධුර භාෂණයෙන් මෛත්‍රී බුදුන් දකින්න කෙරෙන ප්‍රාර්ථනයකි

බක්මහ මංගල්‍යය භෞතික ආශ්වාදනයට වැඩි නැඹුරුතාවක් දක්වද්දී වෙසක් මංගල්‍යය අධ්‍යාත්මික සංහිඳියාවට තැන දීමටත් අනුකූලව සිරිත් විරිත් සම්පාදනය වී ඇති ආකාරය මෙම උත්සව දෙනෙහි ආකර්ශනය විමසන කල පෙනී යයි. වෙසගය දාන ශිල බාවනා ප්‍රම්බ පූජාර්ථය ආමිස හා ප්‍රතිපත්ති අංග දෙක ඔස්සේම විවිධ වැඩ සටහන් සමග ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව තරම් වෙසක් සමයට දන්සැල් පවත්වන මහා ශීල වයාපාර භාවනා වෙසක් තොරණ ඇතුලු විවිධ සැරසිලි කරන වෙනත් රටක් නැති තරම් ය. ශ්‍රද්ධාව මෛත්‍රිය කරුණාව පෙරදැරි කරගෙන වෙහෙර විහාර ප්‍රමුඛ විවිධ පූජායතන එකට පෙළ ගැසී සම්මාදන් වන මෙම වැජසටහන්වල ඇතැම් පටු ද්‍රීවලකම් තිබුණත් සමස්ථයක් වශයෙන් බුද්දාලම්බන ප්‍රීතිය සමග බිහිවන මංගල්‍යයක සිරියාව ඒ තුළ ආව ප්‍රතිරාව නංවන බවද සිහි ගැන්විය යුතු ය.

## ගීතය 7 බුද්ධානුභාවේන




මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ සාරගර්භ ගේයපදවැලකින් යුක්තව විශාරද නන්දා මාලිනියගේ සුමධුර ස්වර භාෂණයෙන් අලංකෘත මෙම බ්ද්ධානුස්මෘති ගීතය අපගේ වෙසග ප්‍රාර්ථනා සියල්ල අමෘතයක් මෙන් කැටි කොටගත් නිර්මාණයක ලක්ෂණ ගෙනහැර දක්වයි. එය බුදු සිරිතත් බොදු දර්ශනයත් එකට කැටි වී ගීතයකට වඩා ජයමංගල අෂ්ඨකයකට සමරූපී වන්නකි. දහම් දිවයිනක් ලෙසට වෙසක් මංගල්‍යය පැවැත්වෙන දින ගණන පුරාවට රට පුරා මෙම ගීත රාව ප්‍රතිඑාව නැංවෙන විට ඒ හඬින් ශ්‍රද්ධාවේ පහන් සිළු දැල්වී සිත් සතන් සුවපත් වනු නොඅනුමාන ය.